**සීමාසහිත ජාතික කඩදාසි සමාගම - 2014/ 2015**
---

**සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබාගන්නා ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**
---

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**
---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.**

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**
---

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගතනොවූ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.**

**1.5 සමාගමේ අඛණ්ඩ පැවැත්ම**
---

**ජාතික කඩදාසි සමාගම අඛණ්ඩ පැවැත්ම සංකල්පය මත මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණද, වාර්තා කරන දිනට සමාගමට අයත් වාලච්චේන කම්හල සමාලෝචිත වර්ෂය තුළ සිය මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබු අතර 2011 නොවැම්බර් 15 දින ඇඹිලිපිටිය කම්හල පුද්ගලික සමාගමකට බදු දී තිබුණි. තවද 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම රුපියල් මිලියන 123 ක සහ ඊට පෙර වර්ෂය සඳහා රුපියල් මිලියන 209 ක අලාභයක් වාර්තා කර තිබුණි. එසේම 2015 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් රුපියල් මිලියන 1,090 ක සෘණ ශුද්ධ ශේෂයක් වාර්තා කර තිබිම හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත වන බව විගණනයේදී නිරීක්ෂණය විය.**

## 2 මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය ව්‍යාවනය

------------------

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත සාක්ෂි ලබාගැනීමට මට නොහැකිවිය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **2014** මාර්තු **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වෙනත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලද අතර ඒ සඳහා අහිතකර මතයක් **2017** පෙබරවාරි **02** දින ලබා දී තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂයන්හි සුදුසු බව සනාථ කර ගැනීමට සමත් ප්‍රමානවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

(ආ) සමාගම විසින් පරිශ්‍රයන් වෙත සහ අදාළ වාර්තාවෙත භෞතිකව ප්‍රවේශ වීමට පහසුකම් ලබා නොදීම හේතුවෙන් වාලච්චේන කම්හලෙහි රු.**38,344,000** ක්වූ මුළු ජංගම නොවන වත්කම්, රු.**177,767,000** ක්වූ මුළු ජංගම වත්කම් හා රු.**406,086,000** ක්වූ මුළු ජංගම නොවන වගකීම් සමාලෝචනය සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොමැති හෙයින් ශේෂ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඇ) ඇඹිලිපිටිය කම්හල **2011** නොවැම්බර් **15** දින පුද්ගලික සමාගමට බදුදී තිබූඅතර ඒ සම්බන්ධයෙන්වූ ගිවිසුමක් හෝ වෙනත් ප්‍රමාණවත් සාක්ෂි නොවීම හේතුවෙන් කම්හලෙහි රු.**17,886,000** ක්වූ මුළු ජංගම නොවන වත්කම්, රු.**11,202,000** ක්වූ මුළු ජංගම වත්කම් හා රු.**483,757,000** ක්වූ මුළු ජංගම නොවන වගකීම් සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඈ) දේපළ පිරියත හා උපකරණ සත්‍යාපනය සඳහා නිසි වාර්තා නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති රු.**33,376,922** ක් වූ දේපළ පිරියත හා උපකරණශේෂය සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඉ) වර්ෂ අවසාන තොග ආගණනය භෞතිකව නිරීක්ෂණය කළ නොහැකිවීම හා තොග ප්‍රමාණයන් හා අගයන්ට අදාලව වාර්තා නොමැතිවීම හේතුවෙන් ශේෂයරු. **15,926,363**ක් වූ තොග සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඊ) ඍජු ශේෂ සනාථ කිරීම් නොමැතිවීම හා වෙනත් විකල්ප විගණන විධි මඟින් ශේෂය තහවුරු කරගැනිමට අවශ්‍ය තොරතුරු හා වාර්තා නොවීම හේතුවෙන් රු.**257,200,355** ක් වූ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ හා රු.**471,307,505** වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු ශේෂ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(උ) ශේෂ සත්‍යාපනය කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි නොවීම හේතුවෙන් රු.45,087,534 ක් වූ ප්‍රාග්ධන සංචිත හා රු.41,777,052 ක් වූ විදේශ ප්‍රදාන ශේෂසත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඌ) රදවාගත් ලාභය බැර කිරීමට අදාළ අනුමැතීන් හා අදාල ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් රු.103,258 ක් වූ රදවාගත් ලාභ ශේෂය සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(එ) සෘජු ශේෂ සනාථ කිරීම් වැළැක්වීම, ණය ගිවිසුම් හා ණය ශේෂයට අදාළ පිළිගත හැකි වෙනත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් රු.159,654,648 ක් වූ විදේශ ණය ශේෂය සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද පාරිතෝෂික දීමනා පිළිබඳ විස්තර හා වර්ෂය තුළදී පාරිතෝෂික වෙන්කිරීම් සිදුකළ පදනම විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් ශේෂය රු.100,681,254ක් වූ ගෙවිය යුතු පාරිතෝෂික දීමනා සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඔ) මූල්‍ය ප්‍රකාශනවල සටහන්කර ඇති ආදායමේ සම්පූර්ණත්වය සහ විකුණුම් පිරිවැයේ නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීමට සාක්ෂිප්‍රමාණවත් නොවීම හේතුවෙන් රු.74,905,615 ක් වූ ආදායම හා රු.243,140,251 ක් වූ විකුණුම් පිරිවැය සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඕ) එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තු සහ ආදායම් බදු වැනි ව්‍යවස්ථාපිත බදු සඳහා සමාගම බැඳී ඇති හෙයින් සමාගම විසින් මෙම බදු සඳහා නිසි ගෙවීමක් කර ඇති බවට හෝ මූල්‍ය ප්‍රකාශන වල එවැනි හිඟ මුදල් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට සහතික කිරීම සඳහාවිගණන සාක්ෂි ප්‍රමාණවත් නොවිය.

(ක) පහත වියදම් සනාථ කිරීම සඳහා මෙහි දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය

(i) රු. 20,705,764 ක් වූ වැටුප් හා වේතන සනාථ කර ගැනීමට අදාලව පෞද්ගලික ලිපිගොනු, වැටුප් ලේඛන සාරාංශ සහ ගෙවීම් සඳහා අදාළ අනුමැතීන්.

(ii) සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවා තිබූ රු.528,085 ක ගෙවීම් සනාථ කිරීම සඳහා ප්‍රේෂණ පත්‍ර සහ ගණනය කිරීම් හා ගෙවීම් වලට අදාළ තොරතුරු.

(iii) සේවක අර්ථසාධක අරමුදලට ගෙවා තිබූ රු.2,112,340 ක ගෙවීම් සනාථ කිරීම සඳහා ප්‍රේෂණය කිරීම් සහ ගණනය කිරීම් වලට අදාළ තොරතුරු.

(iv) බදුකුලී වරිපනම් සහ වෙනත් බදුවලට අදාළව ගෙවා තිබූ රු.3,756,229 ක ගෙවීම් තහවුරු කිරීමට අදාල ආධාරක ලියකියවිලි සහ බදු ගිවිසුම්.

(v) කොන්ත්‍රාත් සේවක දීමනාවලට අදාළව සේවකයන්ට ගෙවා තිබූරු.1,440,467ක ගෙවීම් සඳහා අනුමැතීන්, කොන්ත්‍රාත් සේවකයින් සේවයේ යෙදවීමට අදාල ලේඛන.

(vi) වාහන කුලීවලට අදාළව ගෙවා තිබූ රු.1,035,000 ක ගෙවීම් සඳහා අනුමැතීන්, කුලී ගිවිසුම් සහ ගෙවීම් තහවුරු කිරීමට අදාල ආධාරක ලියකියවිලි.

(vii) අලුත්වැඩියා සහ නඩත්තු හා ඉවතලන කඩදාසි වියදම් සම්බන්ධයෙන් ගෙවා තිබූ පිළිවෙලින් ගෙවා තිබූ රු.2,852,751 ක් හා රු.3,222,458 ක් වූ ගෙවීම් සඳහා වන අනුමැතීන් සහ ගෙවීම් තහවුරු කිරීමට අදාළ ආධාරක ලියකියවිලි.\

3 මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 123,638,759ක බදු පෙර ශුද්ධ අලාභයක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු. 209,226,700 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 85,587,941ක ශුද්ධ අලාභය අඩුවීමක් නිරීක්ෂණය විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
------------------------------------

3.2.1 ප්‍රමාණාත්මක ගණකාධිකරණ අනුපාත
------------------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ දල ලාභ අනුපාතය, ශුද්ධ ලාභ අනුපාතය සෘන අගයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2015 ප්‍රතිශතයක් ලෙස | 2014 ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| දල ලාභ අනුපාතය | (225) | (235) |
| ශුද්ධ ලාභ අනුපාතය | (165) | (271) |

3.2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
------------------------------------

ජංගම අනුපාතය පිරිහී තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී 1:0.31 වශයෙන් ස්ථාවරව පැවතුණි. ක්ෂණික අනුපාතයද පිරිහී තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේදී 1:0.22 වූ අතර ඉකුත් වර්ෂයේදී 1:0.21 ක් විය.

4 මෙහෙයුම් සමාලෝචනය
--------------------------

4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
----------------------------

(අ) වාලච්චේන කර්මාන්තශාලාව
-------------------------------

2015 පෙබරවාරි 09 දිනට ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීමට නියමිතව තිබූ හිඟ මුදල වූ රු.472,210,131 ක් නොගෙවීම නිසා එදින සිටවාලච්චේන කර්මාන්තශාලාවට ලබාදෙන විදුලිය තාවකාලිකව විසන්ධිකර තිබුණි. විදුලි සැපයුම නොමැති නිසා එදින සිට වාලච්චේන කර්මාන්තශාලාවේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුවී නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව
-------------------------------

2011 දෙසැම්බර් 19 දිනැති අංක 1037 දරන බදු ගිවිසුම අනුව මෙම කර්මාන්තශාලාව නැවත ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට (Restoration) හා නැවත සංවර්ධනය (Re development) කිරීම සඳහා රු. මිලියන 600 ක ප්‍රතිෂ්ඨාවකට වර්ෂ 30 ක කාලයක් සඳහා අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05 පිහිටි රාජ්‍ය සම්පත් කළමනාකරණ සමාගම සහ සීමාසහිත ජාතික කඩදාසි සමාගම යන ආයතන යුගලය සහ අංක 03/43, වෙන්ටනෝර් ඇවනිවු, බටහිර පර්ත්, බටහිර ඕස්ට්‍රේලියාව ව්‍යාපාරික ලිපිනයැති සීමාසහිත පර්ත් ඉන්ජිනේරු හා මේන්ටේනන්ස් (පුද්ගලික) සමාගම අතර ගිවිසුම්ගත වී තිබුණි. එකඟ වූ ප්‍රතිෂ්ඨාවෙන් රු. මිලියන 400 පමණක් අදාළ බදුකරු ගෙවා තිබූ අතර ඉතිරි මුදල ගෙවා නොතිබුණි. සුළු කාලයක් නිෂ්පාදන කටයුතු සිදුකරන ලද මෙම බදුකරු 2012 වර්ෂයේදී නිෂ්පාදන කටයුතු නතර කර තිබුණි.

නිසි පරිදි බදුවාරික නොගෙවීම මත රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් නීතිපති උපදෙස් මත අදාළ බදු ගිවිසුම 2014 සැප්තැම්බර් 25 දින අවලංගුකර තිබුණි.

ඒ අනුව වර්තමානයේදී මෙම කර්මාන්ත ශාලාවේ කිසිදු නිෂ්පාදන කාර්යයක් සිදු නොවන බව අනාවරණය වූ අතර කර්මාන්තශාලාවේ වත්කම්වල ආරක්ෂාව සඳහා යොදා සිටි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන්ද වර්තමානයේදී එම දෙපාර්තමේන්තුව විසින් ඉවත් කරගෙන තිබුණි. ඒසේම 2015 සැප්තැම්බර් 13 දින විගණනය විසින් සිදුකළ ස්ථාන පරීක්ෂාවේදී ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලද සණ අපද්‍රව්‍ය තොගයක් කර්මාන්තශාලාවේ ගොඩගසා ඇති බව නිරීක්ෂණය වූ අතර බදුකාර සමාගම ඔස්ට්‍රේලියාවේ පවිත්‍රතා කටයුතු කරන සමාගමක් බවද අනාවරණය විය. තවද 2011 වර්ෂයේදී ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව ප්‍රතිව්‍යුහගතකරණයේදී අමාත්‍යමණ්ඩල සංදේශයට අනුව රජයට ලැබී තිබූ රු. මිලියන 400 ක මුදලින් සේවකයන්හට ගෙවිය යුතු හිඟ මුදල්ද ඇතුළු ඇඹිලිපිටිය කර්මාන්තශාලාවට අයත් සියලු බැරකම් නිදහස් කළ යුතු බව දන්වා තිබුණද, සේවකයන් 04 දෙනෙකුට ගෙවිය යුතු හිඟ පාරිතෝෂික වැටුප් හා අතිකාල දීමනා ගෙවීමට 2011 වර්ෂයේදී ලබාදුන් අධිකරණ නියෝගය මේ වනතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. වෙනත් කරුණු
-----------------

(අ) ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව සතු අක්කර 525ක් වූ වගා ඉඩම් 05ක් සඳහා වර්ෂ ගණනාවක් තිස්සේ නොවෙනස්ව පවතින වටිනාකම රු. 11,188,275 ක් සත්‍යාපනය කළ නොහැකි විය.

(ආ) සීමාසහිත ජාතික කඩදාසි සමාගම සතු කඩදාසි කර්මාන්ත ශාලා දෙකෙන් ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාව 2011 නොවැම්බර් 15 දින පුද්ගලික සමාගමකට බදු දී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පිළිගත හැකි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. වර්තමානයේදී මූල්‍ය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (විමර්ශන අංක FCID/145/15) හා ජනාධිපති විමර්ශන කොමිසම (විමර්ශන අංක PIC859/2015)යන ආයතන විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වාගෙන යනු ලැබේ.

(ඇ) දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සමහර ස්ථාවර වත්කම් සොයා ගැනීමටද නොහැකි විය. එසේම සමාගම විසින් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. තවද සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් භාවිතයේ පවතින පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයක් ද සිදු කර නොතිබුණි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 16 අනුව දේපල පිරියත හා

උපකරණ සහ වෙනත් වත්කම්වල සුන්බුන් වටිනාකම, ඵලදායි ජීවිත කාලය හා ක්ෂය ක්‍රමය සුදුසු ලෙස සමාලෝචනය කිරීම හා ගැලපීම සෑම වර්ෂයකම අවසානයට සිදු කල යුතුය.

(ඇ) කාර්මික ආරවුල් සම්බන්ධව සමාගමට එරෙහිව නඩු කිහිපයක් අධිකරණ වල විභාග වන බවට නිරීක්ෂණය වූ අතර ව්‍යවස්ථාපිත ගෙවීම් හා අධිකරණයේ විභාග වන නඩු තුලින් පැන නඟින අසම්භාව්‍ය බැරකම් වෙනුවෙන් වෙන්කිරීම් හා අනාවරණය කිරීම් කර නොතිබුණි.

(ඉ) සමාගමේ කටයුතු සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ට ඇති ඇල්ම හා ගිවිසුම් පිළිබඳව තොරතුරු පූර්වගාමී විගණකට ලබා දී නොතිබු අතර 2012 අප්‍රේල් 02 දින සිට බල පැවැත්වෙන පරිදි සමාගමේ පාලනය සඳහා නිසි බලධාරියෙකු පත් කර තිබුණි.